www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ව්‍යසනය මැද දී ලංකාවේ ජනාධිපති "එක්සත්" වන ලෙස ඉල්ලා සිටියි

## Amid the devastation Sri Lankan president issues appeal for "unity"

**විජේ ඩයස් විසිනි**

**2004 දෙසැම්බර් 30**

ඉන්දියානු සාගරයේ සුනාමි රළ පහර ශ්‍රී ලංකාව වනසා දින දෙක හමාරකට පසුව ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මෙම ඛේදවාචකය පිළිබඳව ජාතිය ඇමතුවා ය. අපැහැදිලි බව, වංක බව හා හිස් අනුකම්පාව ගැබ් කර ගත් ඇගේ කතාව සමන්විත වූයේ, හුදෙක් ඇගේ ආන්ඩුවේ පමනක් නොව, දිවයිනේ ධනපති පාලනයෙහි ම බංකොලොත් බව පිලිබඳ පාපොච්චාරනයකිනි.

නිශ්චිත කරුනු සඳහන් කිරීම පවා කුමාරතුංගට අසීරු විය. සඳුදා 2,200ක් වූ නිල මරන සංඛ්‍යාව බ්‍රහස්පතින්දා වන විට 23,000 දක්වා ඉහල නැගුනු අතර හදිසි සේවා කම්කරුවන්, සුන් බුන් සෝදිසි කිරීම හා වඩාත් දුෂ්කර ප්‍රදේශවලට ලඟාවීම සමග, එම සංඛ්‍යාව තව දුරටත් ඉහල යනු ඇතැයි අපේක්ෂා කෙරිනි. දශ ලක්ෂයකට අධික ජනතාවට, එනම් ජනගහනයෙන් 19ට කෙනෙකුහට, පමන උන් හිටි තැන් අහිමි විය. මොවුන්ගෙන් බොහෝ දෙනෙකු නිල දරිද්‍රතා සීමාව වූ මසකට රුපියල් 1000ක් හෝ ඇ. ඩොලර් 10ට පහලින් ජීවත් වන්නවුන් ය. ඔවුන් සතුව යම් දෙයක් තිබුනේ ද, ඒ සියල්ලත්, ඔවුන්ගේ ජීවන මාර්ගයනුත් දැන් අහිමි වී ගොසිනි. ඔවුන් හට ජීවත් වීමේ මගක් නොමැත.

ජනාධිපතිනිය ''ගැඹුරු තිගැස්ම හා ශෝකය'' පිලිබඳව කතා කල අතර ඇයගේ ''ගැඹුරුතම කම්පාව'' ව්‍යසනයට ගොදුරු වූවන් හට පල කර සිටියා ය. එනමුදු ඇයගේ කතාවෙහි අවධාරනය යෙදුනේ ඇයගේ ආන්ඩුවේ ක්‍රියා කලාපය හෝ අක්‍රීයතාවය යුක්ති සහගත කිරීමට හා ''ස්වාභාවික ව්‍යසනය'' ඉදිරියේ ''එක්සත්'' වීම සඳහා ආයාචනයක් ඉදිරිපත් කිරීමට ය. ''ව්‍යසනයට ගොදුරු වූවන් සියල්ලන්ට ම ඉක්මන් සහනය ලබා දීමටත්, පූර්ව අනතුරු ඇඟවීම් ලබා ගත හැකි වන අයුරින්, අනතුරු කලමනාකරන ආයතනය වර්ධනය කිරීමට හා යලි ඉදිකිරීම් සඳහා විශේෂ කාර්ය සාධක හමුදාවක් ස්ථාපිත කිරීමටත් ඇය පොරොන්දු වූවා ය.

මෙම කිසිම පොරොන්දුවක් විශ්වාස කල හැකි නො වේ. ආධාර පසෙක තිබිය දී ආන්ඩුවේ නිලධාරියෙකු පවා නො දුටු බවට, අනතුරට ගොදුරු වූවෝ, කොලඹ නගරය තුල ම මැසිවිලි නැගුහ. මාධ්‍ය වාර්තාවන්ට අනුව ගාල්ල ප්‍රදේශයේ අනතුරට ගොදුරු වූවන් දහස් ගනනකට ආහාර, පිරිසිදු ජලය හෝ බෙහෙත් ද්‍රව්‍ය ලැබී නොමැති අතර තමන්ගේම සීමිත සම්පත් හෝ පුද්ගලික ආධාර මත යැපීමට ඔවුන්ට සිදුව ඇත. දරුනු ලෙස විනාශයට ලක් වූ නැගෙනහිර හා උතුරු වෙරලබඩ ප්‍රදේශ පිලිබඳ තොරතුරු හිඟ වුව ද එහි තත්වය මීට වඩා කිසි ලෙසකින් හෝ වෙනස් යැයි විශ්වාස කිරීමට හේතුවක් නොමැත.

සිය දහස් ගනනක් ජනයා හට මූලික අවශ්‍යතා සපුරා ගත නො හැකි අතර එම ජනයා රෝගයන්ට හා සමහර විට සාගින්නට ගොදුරු වීමේ සැබෑ අන්තරායක් පවතියි. ඔවුන් කරා සමීප වන්නේ හදිසි ආධාර ස්වල්පයක් පමනෙකි. මෙම ව්‍යසනය පිලිබඳව වගකීම රඳා පවතින්නේ, කොලඹ පැවති හා පවතින ආන්ඩුත් ඒවායේ සැලසුම් හා පෙරදැකීම් නොමැතිකමත් මත පමනක් නොව, ලෝකයේ ප්‍රධාන ධනේශ්වර පාලනයන් ද මත ය. ඔවුහු දැන්වුව ද ආධාර ලෙස ලබාදෙන්නේ සොච්චමක් පමනක් නමුදු කුමාරතුංගගේ පැසසුමට ලක් වූහ.

යලි ඉදිකිරීම් පිලිබඳව සලකන කල, එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුව ද එහි පූර්වගාමීන් ද අතීතයේ අනතුරුවල දී ක්‍රියා කල අයුරින් ම මෙවරත් ප්‍රතික්‍රියා කිරීමට හොඳටම ඉඩ තිබේ. ක්ෂනික අර්බුදය පහවී යාමත් සමඟ යලි ඉදිකිරීම් සඳහා ආධාර පිලිබඳ පොරොන්දු වාෂ්ප වී යයි. නිදසුනක් වසයෙන්, නියගයෙන් හා අනතුරුව පැමිනි ජල ගැල්මෙන් මාස කිහිපයකට ඉහත දී පීඩාවට පත් දස දහස් ගනනක් ජනයා ආධාර ලැබෙන තෙක් තවමත් බලා සිටිත්.

අනාගතය සඳහා පූර්ව අනතුරු සංඥා ක්‍රමයක් ලබා දීමට කුමාරතුංග දැන් පොරොන්දු වන්නී ය. එනමුදු සුනාමි අනතුරට පෙර ඒ පිලිබඳ අනතුරු ඇඟවීමක් නො කලේ මන්දැයි ඇය හෝ ඇයගේ ආන්ඩුවේ කිසිම නිල ඒජන්සියක් හෝ පැහැදිලි කර නැත. සුමාත්‍රා දූපත අසල ඇවැන්ත භූමි කම්පාව පිලිබඳ පලමු වාර්තා පැමිනි විට අනතුරු ඇඟවීමක් නො කිරීම, අඩුම ලංසුවෙන් සැලකුවත් එල්ල වන්නේ පැවති ව්‍යාකූලත්වයට හා සැලසුම් රහිත බව වෙත ය. ඉන්දියානු සාගරයේ සුනාමි සංඥා ක්‍රමයක් නොමැති බැවින් වඩදිය රැල්ලක් පැමිනෙනු ඇතැයි ක්ෂනිකව සනාථ කිරීමට ශ්‍රී ලාංකික බලධාරීන්ට නොහැකි විය.

එනමුදු භූමි කම්පාවේ දැවැන්ත භාවය ම එහි අනතුරුදායක ප්‍රතිවිපාක පිලිබඳව ගනන් බැලීමක් කිරීමට පෙලඹවීමක් කල යුතුව තිබිනි. එහෙත් එවන් කිසිවක් කෙරුනේ නැත.

ජනාධිපතිනියගේ හිස් පොරොන්දු පිටුපස ඇත්තේ ව්‍යසනයට ගොදුරු වූවන් පිලිබඳ උනන්දුව නොව අනතුරින් පැන නැගිය හැකි දේශපාලන වාතාවරනය පිලිබඳ වැඩෙන චකිතයකි. ඉරිදා වඩදිය රැල්ලට පෙරාතුව සිට ම ශ්‍රී ලංකාවේ දේශපාලන තත්වය අතිශයින් ම අස්ථාවර ව පැවතිනි. රටෙහි 20 අවුරුදු සිවිල් යුද්ධය යලි පැන නැගීම නැවතී තිබුනේ දෙදරීමට ලක් වූ වෙඩි නැවැත්වීමේ ගිවිසුමකින් වූ අතර 2003 අප්‍රේල් මස සිට ගැටුම අවසන් කිරීම සඳහා වූ සාම සාකච්ඡා නැවතී තිබිනි. කුමාරතුංග හා ඇගේ එජනිස ආන්ඩුව, පසුගිය අප්‍රේල් මස මැතිවරනය ජය ගත්තේ, දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානය සමග සාකච්ඡා පැවැත්වීම මගින් කලින් පැවති ආන්ඩුව රට විකිනූ බවට හෙලා දකිමින් හා ජීවන කොන්දේසි වර්ධනය කිරීමට පොරොන්දු දෙමිනි. මාස දහයකට පසුව, දිගටම ඉහල යමින් තිබෙන භාන්ඩ මිල හා බිඳුනු මැතිවරන පොරොන්දු හමුවේ එජනිස ආන්ඩුව වැඩෙන මහජන විරෝධයකට මුහුන දී සිටියි.

මේ සතියේ දුෂ්කර සිදුවීම් මෙම ආතතීන් දැවැන්ත බවට පත් කොට වඩාත් කුපිත කරවීමට පමනක් හේතු වනු ඇත. දශ ලක්ෂ සංඛ්‍යාවකට අත් විඳීමට සිදුවුනු වත්මන් කම්පනය හා වික්ෂිප්තබව, සීමිත සහනයන් සැලසීමට පවා ආන්ඩුවේ පවතින අසමත්බවට එරෙහි, කෝපයක් බවට වේගයෙන් හැරිය හැකි බව කුමාරතුංග හා සමස්තයක් ලෙස දේශපාලන සංස්ථාපිතයම හොඳින් දැන සිටිත්. කුමාරතුංගගේ කතාව අන් සියල්ලටමත් වඩා මෙම දේශපාලන කාල බෝම්බය නිෂ්ක්‍රීය කිරීමට හා එමෙන්ම සිදු විය හැකි වඩාත්ම නරක තත්වයට සූදානම් වීමකි.

ජනාධිපතිනිය විසින් සන්නද්ධ හමුදා හා පොලීසිය වෙන් කොට ගෙන විශේෂ වසයෙන් ප්‍රශංසා කරනු ලැබීම අහම්බයක් නො වේ. අනතුරට ලක් වූ ප්‍රදේශවලට යෙද වූ හමුදාව හා පොලීසිය යම් සහායක් ලබා දුන් බවට සැකයක් නැත. සාමාන්‍ය සොල්දාදුවෝ හා පොලීස් නිලධාරීහු මහජනයා මුහුන දී සිටින දරුනු තත්වයන්ගෙන් ඔවුන් මුදවා ගැනීමට වෙහෙස දැරූහ. නමුත් ඒ හා සමානවම, ආන්ඩුවට එරෙහිව පැන නැගීම ඇරඹෙන්නා වූ ඕනෑම දේශපාලන විරුද්ධත්වයක් මැඩීමට මෙම ආරක්ෂක හමුදාවන්ම යොදා ගැනෙනු බව නිසැක ය. රාජ්‍ය යන්ත්‍රනයේ යථා ආකල්පය ඉරිදා ගාල්ල සිරගෙයෙහි ජේලර්වරුන්ගේ ක්‍රියා කලාපයෙන් සංකේතවත් වීය. සිරකරුවන් ජලයේ ගිලීමෙන් බේරීමට දුෂ්කර ප්‍රයත්නයක නියැලෙන අතරතුර අවම වසයෙන් ඉන් දෙදෙනෙක් වෙඩි තබා ඝාතනය කෙරුනාහ.

## "එක්සත්වීම" සඳහා ඉල්ලීම

කුමාරතුංග ඇයගේ කතාව තුල ජාතික එක්සත් වීමක් ඉල්ලා සිටිමින් මෙසේ පැවසුවා ය. ''සිංහල, දෙමල හෝ මුස්ලිම් ලෙස වෙන් වසයෙන් මේ සා දැවැන්ත ස්වාභාවික ව්‍යසනයක් සමග පොර බැදිය නො හැකි ය. අප සියල්ලන්ම එක්ව නැගී සිටිය යුතු ය. කිසිම එක් ජන වර්ගයකට මේ රට ගොඩ නැගීම කල නොහැක. මෙම දැවැන්ත අභියෝගයට ඔවුන්ගේ ම විසඳුම් ලබාදීම දේශපාලන පක්ෂවලට වුවද දුෂ්කර කාර්යයකි. එබැවින් මෙම දැවැන්ත විනාශයෙන් රට යලි ගොඩ නැංවීමේ උතුම් කාර්යයේ දී මගේ බලවත් ඉල්ලීම වන්නේ සියලු වෙනස්කම් අතහැර, අපව වෙන් කරන්නා වූ සීමාවන් අභිබවමින්, තනි රටක් හා තනි ජනතාවක් ලෙස අප එක්ව නැගී සිටිය යුතු බව යි.''

ප්‍රශ්නයක් මෙසේ මතු වේ: එක්සත් වීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට මෙවන් ඛේදවාචකයක් සිදුවන තෙක් බලා සිටිය යුත්තේ මන්ද? කුමක් නිසා ද යත්, අන්තර්ගතයෙන් ගත්විට, මෙය සාමාන්‍ය මහ ජනතාව වෙත යොමු වූ ඉල්ලීමක් නොවන හෙයිනි. මෙය, සියල්ලටමත් වඩා, සුනාමි තත්වය තුල පැන නැගෙන ජනතා විරුද්ධත්වයට හා විරෝධයට එක්සත්ව මුහුන දීම සඳහා, දැන් පවත්නා උග්‍ර අභ්‍යන්තර සටන් තාවකාලිකව නවතා දැමීමට ශ්‍රී ලංකාවේ සුපිරි පාලක පන්තියෙන් කරන ඉල්ලීමකි.

කම්කරු පන්තිය වාර්ගික රේඛා ඔස්සේ බෙදීමට හා ඔවුන් මත තම බල ග්‍රහනය පවත්වා ගැනීමට, 1948 හි නිදහසේ සිට ම පාලක පන්තියේ නොයෙක් ස්ථරයන් වර්ගභේදවාදය උසිගැන්වී ය. සිවිල් යුද්ධයට මග පාදමින් හා ජීවිත 65,000ක වියදමෙන්, ගැටුම පවත්වා ගෙන යාමට තුඩු දුන්, සිංහල ස්වෝත්තමවාදය ඇතිදැඩි කිරීමේ සෘජු වගකීම දරන්නේ කුමාරතුංගගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) හා ප්‍රධාන විරුද්ධ පක්ෂය වන එක්සත් ජාතික පක්ෂය (එජාප) යි. මේ වනවිට කුමාරතුංගගේ ආන්ඩුව ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වැනි සිංහල අන්තවාදී පක්ෂවල සහය මත සෘජුවම පදනම් වී සිටියි.

පුදුමයක් නොවන පරිද්දෙන්, ''එක්සත්වීම'' යන තේමාව නිල සංස්ථාපිතයේ වෙනත් කොටස් ද විසින් ද යොදා ගනු ලැබේ. මින් සමහරු ''ජාතික එක්සත් ආන්ඩුවක්'' මගින් සිවිල් යුද්ධය අවසන් කර ම්ලේච්ඡ ''ප්‍රතිව්‍යුහකරන'' පියවර මගින් ආර්ථිකය යලි ගොඩ නැංවීමට වසර ගනනාවක් තිස්සේ ඉල්ලා සිටි අය වෙත්.

*ඩේලි මිරර්* පුවත්පත සිය කතුවැකියක් ලියමින්, එක්සත්බව, ශක්තිය හා දයාව මගින් ''දහස් සංඛ්‍යාත අවාසනාවන්ත ජනතාව මානසිකව හා ශාරීරිකව අත්විඳින වේදනාව සමනය කරන ලෙස'' ඉල්ලා සිටියි. ව්‍යසනය පිලිබඳව කටයුතු කිරීම සඳහා තනා ගැනුනු සර්ව-පාක්ෂික කමිටුවට ආන්ඩුව සමග එක්ව සහභාගි වීමට එජාපය ගත් තීන්දුව එය පැසසුමට ලක් කලේ ය. විදේශගතව සිටින ශ්‍රී ලාංකිකයන් තම පුවත්පතට දුරකථනයෙන් කතා කොට, ජාතික එක්සත් බව ඇතිකිරීම සඳහා ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටි බව

පවසමින් ද *අයිලන්ඩ්* පත්‍රයේ කතුවැකියක් ද ඊට සමාන ඉල්ලීමක් ඉදිරිපත් කලේ ය.

ප්‍රධාන ව්‍යාපාරික කවුන්සිලයන්ගෙන් නිර්මිත ඒකාබද්ධ ව්‍යාපාරික සංසදය (ජොයින්ට් බිස්නස් ෆෝරම්) ප්‍රකාශයක් නිකුත් කරමින් මෙසේ කියා සිටියේ ය: ''මෙම බැරෑරුම් ජාතික ආපදා අවස්ථාව, ශ්‍රී ලංකාවේ සියලු දේශපාලන පක්ෂවලට සිය වෙනස්කම් බැහැර කර ඒකාබද්ධව ක්‍රියා කිරීමට හා මෙම ව්‍යසනයට මුහුන දීම සඳහා මානසික ශක්තිය හා ධෛර්යය සපයමින් නායකත්වය ලබාදීමට ලැබුනු අනර්ඝ අවස්ථාවක් බව අපට තදින්ම හැඟී යයි.''

එක්සත් වීම පිලිබඳ කැඳවුම විමුක්ති කොටි සංවිධානයට ද පරීක්ෂාකාරී ලෙස ඉදිරිපත් කර තිබේ. විසි වසරක යුද්ධයෙන් හා සුනාමි රල වේගයේ පූර්න විනාශකාරීත්වයෙන් වැනසීමට ලක්ව ඇති, උතුරු හා නැගෙනහිර ගම්වැසියන්, කම්කරුවන් හා කුඩා ව්‍යාපාරිකයන් මුහුන දෙන කොන්දේසි අතිශයින්ම දුෂ්කර ය. සමහර ප්‍රදේශවල විමුක්ති කොටි සංවිධානයේ නිලධාරීන් හා රාජ්‍ය හමුදා එකතු වී ඒකාබද්ධ සහන මෙහෙයුම් දියත් කරති. කෙසේ වුවද වෙනත් ප්‍රදේශවල දී සොල්දාදුවන්, සිංහල වර්ගවාදී මැරයින් හා එක්ව, ස්වෙච්ඡා සහන සංවිධාන විමුක්ති කොටි පාලන ප්‍රදේශවලට ඇතුල්වීම වලක්වා තිබේ.

මෙම කරුන ද සිත තබා ගනිමින්, කුමාරතුංගගේ ඉල්ලීම තව දුරටත් යොමු වූයේ වර්ගය, භාෂාව හා ආගම නොතකා සියල්ලන්ම එකිනෙකාට උදව් කල යුතු ය යන පුලුල් ලෙස දැනුනු මනෝගතියට ආයාචනය කිරීම මගින් ආන්ඩුවේ අක්‍රියාකාරිත්වයට එරෙහි වෛරය නිෂ්ක්‍රීය කිරීමට ය. ආන්ඩුවට ප්‍රතිකූලව බොහෝ පුද්ගලයින් දැනටමත් අසාමාන්‍ය තරමේ නිර්භීත බවක්, පුද්ගල කැපවීමක් හා ත්‍යාගශීලී බවක් පෙන්වා තිබේ.

එසේ වුවත්, ව්‍යසනයේ පරිමාව පිලිබඳව දැවැන්ත වගකීමක් උසුලන්නා වූ දේශපාලන සංස්ථාපිතය සමග එකමුතු වීමෙන් කම්කරු පන්තියට ලැබිය හැකි දෙයක් නැත. සාමාන්‍ය වැඩකරන ජනයාගේ ස්වයං ක්‍රියාකාරීත්වය පෙන්වා දෙන්නේ, පොහොසත් සුලුතරයක ලාභ පොදි වෙනුවට බහුතරයක සමාජ අවශ්‍යතා සැපිරීමටත්, සමස්තයක් ලෙස ඉහල සිට පහලට සමාජය යලි ගොඩ නැගීමටත්, දේශපාලන ව්‍යාපාරයක් තැනීම සඳහා තවත් පියවරක් ඉදිරියට තැබීමේ අවශ්‍යතාව යි.

සිය කතාව අවසන් කරමින්, කුමාරතුංග, ශ්‍රී ලාංකික පාලක පන්තිය අනාදිමත් කලක සිට යොදා ගන්නා ක්‍රම වේදයෙහි පිහිට පැතී ය: එනම් රටෙහි ආගමික ආයතන පිටුපස රැලි වන ලෙසට ජනතාවට කියා සිටීම යි. දෙසැම්බර් 31 දින ජාතික ශෝක දිනයක් ලෙස ප්‍රකාශයට පත් කල ඇය, මරනයට පත් වූවන් පිලිබඳව විනාඩි තුනක නිශ්ශබ්දතාවක් පැවැත්වීම සඳහා, සියලුම ජනයාට නොයෙකුත් ආගමික සිද්ධස්ථානයන්ට එකතු වන ලෙස කියා සිටියා ය. ''වමෙහි'' ජරාජීර්න වූ පක්ෂ හා වෘත්තීය සමිති නිලධරයද ඇතුලුව, සියලු දේශපාලන පක්ෂ, මෙම වංචනික කාර්යය සඳහා කුමාරතුංග සමග අත්වැල් බැඳ ගන්නා බවට සැකයක් නැත.

වත්මන් තත්වයෙහි යථා හේතූන් පිලිබඳව විචාරාත්මක පරීක්ෂනයක් පැවැත්වීම අධෛර්යමත් කරවීමට ඔවුහු බලාපොරොත්තු වෙති. සිය දහස් ගනනක් ශ්‍රී ලාංකික ජනතාව හා දකුනු ආසියාවේ දශ ලක්ෂ ගනනක්, සුනාමි අභියස මුහුන දී සිටින ව්‍යසනය නො වැලැක්විය හැකි දේව කාර්යයක් වනවා තබා මුලුමනින් නො වැලැක්විය හැක්කක් වූයේ ද නැත. වඩදිය රැල්ල පැන නැංවූ භූමිකම්පාව සත්තකින් ම ස්වාභාවික හේතු මත සිදු වුව ද, ප්‍රතිඵල මෙතරම් විනාශකාරී වූයේ ඇයි ද යන්න පිලිබඳව බැරෑරුම් ප්‍රශ්න තවමත් නොවිසඳී පවතියි.

පූර්න නිරවද්‍යතාවයකින් යුතුව භූමි කම්පනයන් පෙර දැකීමට විද්‍යාවට තවමත් නොහැකි වී ඇතත්, සුනාමි රලවල භයානක බව පිලිබඳව අනතුරු ඇඟවීම සඳහා සංඥා පද්ධතියක් පැසිෆික් සාගරයේ පවතියි. එවන් පද්ධතියක් ඉන්දියානු සාගරයේ නොමැත්තේ මන්ද? වඩදිය රැලිවලට පමනක් නොව වෙනත් ස්වාභාවික විපත්වලට ද ගොදුරුවන අයුරින් දශ ලක්ෂ සංඛ්‍යාත ජනතාවට බෙංගාල බොක්ක වටා පිහිටි පහත් බිම් තීරු තුල අටවා ගැනුනු පැල්පත් තුල ජීවත් වීමට බල කෙරී ඇත්තේ ඇයි?

සුපිරි පාලක පන්තියේ ආර්ථික හා භූලෝපායික අවශ්‍යතා පරදුවට තැබෙන විට නම් සම්පත් හා සැලසුම් බහුලව යෙදවෙයි. තෙල්වලින් පොහොසත් ඉරාකය නීති විරෝධීව ආක්‍රමනය කර අත් පත් කර ගැනීමේදී අවශ්‍යවූ දැවැන්ත සංවිධානාත්මක මෙහෙයුමට බිලියන සිය ගනනින් ගලා ආවේ ය. එනමුදු, දස දහස් ගනනක් ඝාතනය කරමින් දශ ලක්ෂ ගනනකට ඉතාමත් තදින් බලපෑ දකුනු ආසියාවේ ඛේදවාචකයට දින ගනනක් ප්‍රමාද වී ලැබුනු නිල ප්‍රතිචාරය, සම්බන්ධීකරනයෙන් තොර වූ, ඩොලර් දශ ලක්ෂ කිහිපයක් පමනි.

© www.wsws.org